# සිංහල භාෂාව හා සාහිත්‍යය

6 ශ්‍රේණිය



විෂය : සිංහල භාෂාව හා සාහිත්‍යය

ශ්‍රේණිය : 6 ශ්‍රේණිය
වාරය : දෙවන වාරය

ඒකකය - අලි උවදුර

නිපුණතාව : 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

නිපුණතා මට්ටම : 2.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.

අරමුණු

- නිවැරදි හා පැහැදිලි උච්චාරණයෙන් යුතු ව කියවයි.
- නිසි හඬ පාලනයෙන් යුතු ව කියවයි.
- විරාම ලක්ෂණ කෙරෙහි සැලකිලිමත් වෙමින් කියවයි.
- අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.

# සිංහල භාෂාව හා සාහිත්‍යය | 6 ශ්‍රේණිය

## 1. හිස්තැනට සුදුසු පිළිතුර කොටුව තුළින් තෝරන්න

I ........ සිංහල භාෂා සාහිත්‍ය ක්ෂේත්‍රයේ සුවිශාල සේවයක් කළ පඬිවරයෙකි.
II හත්පණ, හීන්සැරය, මඟුල් කෑම එතුමන් විසින් ළමයින් සඳහා රචිත ........ වේ.
III ........ ආදිය එතුමා විසින් රචිත පද්‍ය කෘති අතර වේ.
IV අලි උවදුර පාඩම ........ කෘතියෙන් උපුටා ගන්නා ලදී.
V මුනිදාස කුමාරතුංගයෝ ........ නමින් හඳුන්වති.

| ප්‍රබන්ධ | හෙළයේ මහ පඬිරුවන | කියවන නුවණ | කුමාරතුංග මුනිදාස | කුමර ගී |
|---|---|---|---|---|

## 2. අර්ථය ගැළපෙන සේ යා කරන්න.

| අ | ආ |
|---|---|
| කටට මුත් සිතට නො වන්නේ ය . | පිළිවෙත නො වේ ද? |
| අත්තක් මගේ සොඬට පැමිණියේ යැ | හොඬවැලෙන් අත්තක් කඩා ගත්තේ ය. |
| මගේ සිතින් ඈත් විය. | සිතට සිතෙනුයේ |
| සිත නටවන්නේ | කොළ කන බව සිතට නොදැනෙයි. |
| සිරිත නෝ | මට අමතක විය. |

## 3. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I නිවැරදි ව හා නිරවුල් ව වචන උච්චාරණය සඳහා ලිය වී ඇති පැරණි ග්‍රන්ථය කුමක් ද?
II පැරණි පඬිවරුන් විසින් නිවැරදි ව කියවීම හා ලිවීම හුරු කිරීමට ලියන ලද වෙනත් පොත් තුනක් නම් කරන්න.
III ගද්‍ය හෝ පද්‍ය පාඨයක උච්චාරණය පහසුවෙන් කිරීමට ඔබ කළ යුත්තේ කුමක් ද?
IV කුමාරතුංග මුනිදාස සූරීන් විසින් රචිත ළමා සාහිත්‍යය කෘති අතුරින් ඔබ වඩාත් සිත් ගත් අවස්ථාවක් පිළිබඳ අදහස් දක්වන්න.

### 4. පහත සඳහන් ප්‍රකාශ හරි නම් හරි (✓) ලකුණ ද වැරදි (✗) නම් වැරදි ලකුණු ද යොදන්න.

I යම් පුද්ගලයෙක්, යම් දෙයක් පිළිබඳ පමණක් හඳුන්වන පද නාම පදවලට අයත් වේ. ( )

II යම් නාම පදයක් විස්තර කරන,වර්ණනා කරන පද නාම විශේෂණ පද වේ. ( )

III 'නටයි' යනු ක්‍රියා විශේෂණ පදයකි. ( )

IV යම් ක්‍රියා පදයක් විස්තර කරන, වර්ණනා කරන පද ක්‍රියා විශේෂණ පද වේ. ( )

V විශේෂණ පදවල විශේෂ්‍ය හා විශේෂණය යනුවෙන් කොටස් දෙකක් දක්නට ලැබේ. ( )

### 5. සුදුසු නාම විශේෂණ පදය කොටුව තුළින් තෝරා යොදන්න.

I …….. ළමයා පව් නො කරයි.

II …….. නංගී සිනාසෙයි.

III අම්මා අද …….. බත් ඉව්වා ය.

IV …….. අයියා පාඩම් කරයි.

V …….. පැටියා උඩ පැන පැන නටයි.

| කහ | සුදු | හොඳ | වසු | ලොකු |
|---|---|---|---|---|

### 6. දී ඇති ඡේදයේ ඇතුළත් විශේෂණ පද රවුම් කරන්න.

ලස්සන ගමක ගැහැණු ළමයෙක් හිටියා. එයාට ගමේ හැමෝ ම කතා කළේ රතු හැට්ටකාරී කියලා. ඉතින් මේ රතු හැට්ටකාරී දවසක් තීරණය කළා එයාගේ අත්තම්මා බලන්න යන්න. මේ අත්තම්මාගේ ගෙදරට යන්න තුබුණේ ලොකු කැලෑවක් මැදින්. ඉතින් කැලෑව මැදින් මේ රතු හැට්ටකාරී යනකොට එකපාරට ම භයානක සද්දයක් ඇහුණා.

**අලි උවදුර**

**පිළිතුරු පත්‍රය**

**1.**

I. කුමාරතුංග මුනිදාස මහතා
II. ප්‍රබන්ධ
III. කුමර ගී
IV. කියවන නුවණ
V. හෙළයේ මහ පඬිරුවන

**2.**

| අ | ආ |
|---|---|
| කටට මුත් සිතට නො වන්නේ ය. | පිළිවෙත නො වේ ද? |
| අත්තක් මගේ සොඩට පැමිණියේ යැ | හොඬවැලෙන් අත්තක් කඩා ගත්තේ ය. |
| මගේ සිතින් ඈත් විය. | සිතට සිතෙනුයේ |
| සිත නටවන්නේ | කොළ කන බව සිතට නොදැනෙයි. |
| සිරිත නෝ | මට අමතක විය. |

**3.**

I සකස්කඩ,

II ගණදෙවි හැල්ල, වදන් කවි පොත, බුද්ධ ගජ්ජය, නමාෂ්ට ශතකය, නවරත්නය, ව්‍යාසකාරය, හිතෝපදේශය, ප්‍රත්‍ය ශතකය, අනුරුද්ධ ශතකය, බෞද්ධ ශතකය,සූර්ය ශතකය, වුත්තමාලාව, වුත්තමාලාඛ්‍යාව, අමරසිංහය ( මෙම පොත් අතුරින් ඕනෑම පොත් තුනක්)

III එය කිහිපවරක් හඬ නඟා උච්චාරණය කිරීම

IV හත්පණ , මහලු කෑම, හීන්සැරය යන කෘති අතුරින් වඩාත් සිත් ගත් එක් අවස්ථාවක් පිළිබඳ විස්තර කර තිබිය යුතු ය.

I. ✗
II. ✓
III. ✗
IV. ✓
V. ✓

**5.**

I. හොඳ
II. සුදු
III. කළු
IV. ලොකු
V. වසූ

**6.**

**ලස්සන ගමක, ගැහැණු ළමයෙක්, රතු හැට්ටකාරී, ලොකු කැලෑවක්, භයානක සද්දයක්**